**ශීර්ෂය - 149   කර්මාන්ත අමාත්‍යාංශය**

-------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කර්මාන්ත අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 24 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 21 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**1.6.1 දේපල පිරියත හා උපකරණ**

---

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට අනුව කාර්යාලීය උපකරණ හා ප්‍රවාහන උපකරණ වල වටිනාකම පිළිවෙලින් රු.65,612,794ක් හා රු.480,098,759ක් විය. 2021 ජනවාරි 01 දිනට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ඒවායේ ආරම්භක ශේෂ වටිනාකම පිළිවෙලින් රු.81,862,905ක් හා රු.483,123,759ක් වූයෙන් රු.19,275,111ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට හේතු මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි. | ආරම්භක ශේෂ වෙනසට හේතු විශේෂ වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොමැති බව පිළිගන්නා අතර විගණන කටයුතු සිදු කරන අවස්ථාවෙහි එම වටිනාකමට අදාල හේතු හා එම ශේෂ ගැළපීමට අදාළ ජර්නල්හි පිටපත් අදාල විගණන නිලධාරීන් වෙත ඉදිරිපත් කරන ලදී. එම වෙනස හඳුනාගැනීමෙන් අනතුරුව අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා ජර්නලයක් භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර CIGAS වැඩසටහන මඟින් අදාළ ගැලපීම් සිදුකර ඇත. | බාහිර පාර්ශවයන්ට දැන ගැනීම සඳහා වෙනසට හේතු මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කල යුතුය. |
| (ආ) | අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති රු.52,290,000ක වටිනාකමැති වාහන 4ක් වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහන 04 හිම අයිතිය අමාත්‍යාංශය නමට පවරා ඇති බැවින් ඒවාහි වටිනාකම අමාත්‍යාංශයේ වත්කම් ලෙස ගිණුම් ගත කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | අමාත්‍යාංශය සතු වත්කම් මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතුය. |
| (ඇ) | වෙනත් අමාත්‍යාංශයක් වෙත පවරා දී ඇති අගය රු.12,000,000 ක් වූ වාහනයක් කර්මාන්ත අමාත්‍යාංශයේ වත්කම් ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි. | මෙම වාහනය මුදල් අමාත්‍යාංශය වෙත පැවරීම සඳහා ලිපි ලේඛන ඉදිරිපත් කර ඇති අතර අයිතිය පැවරීම තහවුරු කල පසුව කර්මාන්ත අමාත්‍යාංශයේ වත්කම් ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | අමාත්‍යාංශය සතු නොවන වත්කම් මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කර්මාන්ත අමාත්‍යාංශය නමින් ලියාපදිංචිව ඇති තාවකාලික පදනමින් වෙනත් අමාත්‍යාංශ වෙත ලබා දී ඇති මෝටර් රථ 3 ක වටිනාකම වන රු.15,550,000ක ප්‍රමාණය කර්මාන්ත අමාත්‍යාංශයේ වත්කමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | වාහන 03 මෙම අමාත්‍යාංශය යටතේම ඇති ආයතනයක් වෙත පරිහරණයට වෙන්කර දී ඇති බව දන්වනු කැමැත්තෙමි. අදාළ වාහන අමාත්‍යාංශයේ වත්කම් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | අමාත්‍යාංශය සතු වත්කම් මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතුය. |
| (ඉ) | විවිධ අමාත්‍යාංශ වලින් රු. 20,100,000 ක වටිනාකමැති වාහන 09 ක් කර්මාන්ත අමාත්‍යාංශය වෙත ලැබී තිබූ අතර 2021 දෙසැම්බර් 31 දින වන විට එම වාහන ලියාපදිංචිව තිබූ අමාත්‍යාංශ අහෝසි කර තිබුණි. එම වාහන අමාත්‍යාංශය විසින් භාවිතා කළද ඒවායේ වටිනාකම කිසිම ස්ථානයක ගිණුම් ගත වී නොතිබුණි. | අදාළ අයිතම පවරා ගැනීමෙන් පසු මෙම වාහන 09 ම අමාත්‍යාංශයේ වත්කම් ලෙස ගිණුම් ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | කඩිනමින් පවරා ගැනීමට කටයුතු කර මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කල යුතුය |
| (ඊ) | අමාත්‍යාංශ පුස්තකාලයෙහි පවතින පොත් වටිනාකම අගය කර වත්කමක් ලෙස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. | මේ වන විට අමාත්‍යාංශ පුස්තකාලයේ පවතින පොත් සියල්ල ලැයිස්තුගත කර ඇත. ඒ සඳහා කමිටුවක් පත් කර, පොත් වල වටිනාකම අගය කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | අමාත්‍යාංශය සතු වත්කම් අගය කර මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතුය. |
| (උ) | අමාත්‍යාංශය විසින් වැය දරා ඉදිකරන ලද ගොඩනැගිලි වටිනාකම එහි මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කළ යුතු වුවත් 1997 වර්ෂයේ සිට කර්මාන්තපුර 30ක ඉදිකල පරිපාලන ගොඩනැගිලි 14ක වටිනාකම වූ රු.මිලියන105.878ක ප්‍රමාණය කිසිදු කාර්යාලයක ප්‍රාග්ධනිත කර නොතිබුණි. | මෙම වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ ද සාකච්ඡා කළ අතර ඒ ලැබුණු උපදෙස් පරිදි අදාල නිලධාරීන් විසින් එක් එක් වත්කම් කාණ්ඩ යටතේ වෙන් වශයෙන් හඳුනාගැනීමෙන් අනතුරුව අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් ලෙසට ගිණුම් ගැළපීමට ඉදිරියේ දී කටයුතු කරමින් පවතී. | ප්‍රාග්ධනිත වියදම් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතුය. |

**1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි/ යාවත්කාලීන කර නොතිබුණි. | අලාභ හානි ලේඛණයක් මින් ඉදිරියට පවත්වාගෙන යාමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාලව වැය ශීර්ෂ 25 ක් යටතේ සලසන ලද ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 53 සිට සියයට 100ක පරාසයක ඉතිරි වීම් පැවතිණි. | පොදුවේ ගත් කල මෙම වර්ෂය තුලදී ද සැලසුම් කල පරිදි කාර්යාල කටයුතු සුමටව පවත්වාගෙන යාම, නව ව්‍යාපෘති ආරම්භ කිරීම හා පවත්නා ව්‍යාපෘතීන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කල පරිදි සිදු නොවීම බොහෝ ඉතිරිවීම් සඳහා හේතු විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු බව. |
| (ආ) | 149-1-1-0-2003 වැය ශීර්ෂය සඳහා රු.1,200,000ක් වර්ෂය තුල වෙන්කර තිබියදී තවත් රු.10,500,000ක් පරිපූරක ලෙස ලබාගෙන තිබුණු අතර ඒ අනුව එහි මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.11,700,000 ක් විය. එසේ වුවද, වර්ෂය අවසාන වන විට ඉන් රු.10,581,045ක් ඉතිරි වී තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 90ක් විය. නිසි පරිදි වියදම් ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා ඇස්තමේන්තුවේ දී වෙන් කරන ලද මුදලවත් වියදම් කර නොතිබිය දී අමාත්‍ය කාර්යය මණ්ඩලයේ වාහන සඳහා තවත් රු.10,500,000ක පරිපූරක ඇස්තමේන්තුවක් ලබාගෙන තිබුණි. . | ගරු අමාත්‍යතුමාගෙන් ලද උපදෙස් පරිදි අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MIC/FIN/12/12/2021 හා 2021.04.07 දිනැති ලිපිය මඟින් අලුත්වැඩියා කිරීම වෙනුවෙන් එවකට වෙන් වී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත රු.මි. 10.5ක අතිරේක ප්‍රතිපාදනයක් ඉල්ලුම් කරන ලදි. මිල ගණන් කැඳවීමේදී වාහන 02 කට පමණක් මිල ගණන් ලැබුණි. එම මිල ගණන් අපගේ දළ ඇස්තමේන්තුවට වඩා ඉහළ අගයක් විය. ඒ අනුව එක වාහනයක් හෝ අලුත්වැඩියා කිරීමට එම මුදල ප්‍රමාණවත් නොවූ බැවින් හා එවැනි අධික පිරිවැයක් දරා අළුත්වැඩියා කිරීම ඵලදායී නොවන බැවින් ද, එම රු.මි. 10.5ක අතිරේක ප්‍රතිපාදන ප්‍රමාණයම ආපසු භාණ්ඩාගාරයට පවරා ගැනීමට කටයුතු කරන ලෙස ජාතික අයවැය දෙපාර්තමේන්තුවට දැනුම් දීමට කටයුතු කරන ලදී . | සැලසුමකින් තොරව පරිපූරක වෙන් කර නොගත යුතු බව. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 ජනවාරි හා පෙබරවාරි වවුචර් පරීක්ෂාවේ දී 2021 වර්ෂය වෙනුවෙන් බැදීම් සහ බැරකම් රු.1,932,762ක් හා SA- 92 භාණ්ඩාගාර මුද්‍රිතය අනුව බැරකම් රු.9,981,985ක්ද පැවතිණි. එසේ වුවද අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය වෙනුවෙන් 2022 වර්ෂයේ දී දරන ලද ඉහත බැදීම් ඇතුලත් කරන ලද බැරකම් පිළිබඳ ප්‍රකාශයක් 2021 මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | 2021.12.31 දිනට බැරකම් හා බැදීම් කිසිවක් නොතිබුණි. එදින තෙක් අප සතුව තිබූ සියළු බිල්පත් හා වවුචර්පත් සඳහා 2021.12.31 වන විට ගෙවීම් කර අවසන් කරන ලදී.<br><br>නමුත් 2021 වර්ෂයට අදාළ ඇතැම් වවුචර්පත් හා බිල්පත් 2022 වර්ෂයේ ජනවාරි 01 වෙනි දිනයෙන් පසුව ලැබුණු හෙයින් එම බිල්පත් 2022 ජනවාරි හා පෙබරවාරි මාසයන් හිදී ගෙවීමට කටයුතු කෙරිණි. | බැදීම් ඇතුලත් කරන ලද බැරකම් පිළිබඳ ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| මු.රෙ. 396 - | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ඉක්ම වූ රු.617,007ක් වටිනා චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2022.01.20 දින මෙම චෙක්පත් සියල්ල තාවකාලිකව අමාත්‍යාංශ පොදු තැන්පත් ගිණුමට බැර කල අතර දැනට අදාළ තොරතුරු පද්ධතිය හරහා යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් සිටි. ඉන්පසු එම මුදල් අදාළ ආයතනය වෙත යැවීමට අවශ්‍ය කඩිනම් පියවර ගනිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සෑම ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් හෝ එන්ජිමට සම්බන්ධ අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළයුතු වේ. එසේ වුවද අමාත්‍යාංශයට අයත් වාහන 71කින් වාහන 11ක පමණක් 2021 වර්ෂයට අදාලව ඉන්ධන පරීක්ෂාවක් සිදුකර තිබුණ ද වාහන 60කට අදාලව ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | සාමාන්‍ය ගමනාගමනය පවතින අවස්ථාවල හැකි අයුරින් මෙම පරීක්ෂාවන් සිදු කරන ලද බව කාරුණිකව දන්වමි. | චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | අංක සී ඒ/1/17/1/ හා 2010 මැයි 14 දිනැති ජනාධිපති කාර්යාල චක්‍රලේඛයෙහි 3.1 වගන්තිය | ගරු අමාත්‍යවරුන්ගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන් කරනු ලබන උපරිම නිල වාහන සංඛ්‍යාව 03ක් විය යුතු බව සඳහන් වුවද කර්මාන්ත අමාත්‍යාංශයේ අමාත්‍යවරයාට අමාත්‍යාංශයෙන් ලබා දී තිබූ වාහන 3 ට අමතරව , ලංකා මිනරල් සැන්ඩ් සමාගමේ ඩබල් කැබ් රථයක් 2021 මාර්තු මස සිට භාවිතා කර තිබුණි. කැබ් රථයට 2021 හා 2022 වර්ෂ වෙනුවෙන් ආදායම් බලපත්‍ර සඳහා රු.18,000ක් ද දුම් සහතිකය සඳහා රු.2,260 ක්ද 2021 මාර්තු මස සිට දෙසැම්බර් මස දක්වා රියදුරු හට වැටුප් හා අතිකාල වශයෙන් රු.1,138,140ක්ද ලංකා මිනරල් සැන්ඩ් සමාගමෙන් ගෙවීම් කර තිබුණි. | අමාත්‍යතුමාගේ භාවිතයට ලංකා මිනරල් සැන්ඩ්ස් සමාගමේ වාහනයක් ලබා දීම පිළිබඳව අමාත්‍යාංශයේ සම්බන්ධයක් නොමැත. | චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාත්‍යන්තර වෙළඳපලේ තරඟකාරිත්වයට මුහුණ දියහැකි ගුණාත්මක තත්ත්වයෙන් යුත් භාණ්ඩ නිෂ්පාදනය සඳහා දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම හා දේශීය වෙළඳපොලෙහි අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අවශ්‍ය කර්මාන්ත අංශයන් සංවර්ධනය කිරීම යන අරමුණින් සංවර්ධන අංශ I පිහිටුවා තිබුණි. එහි කාර්යසාධනය පරික්ෂාවේදී සැලැස්ම තුල ඇතුලත් කර තිබූ වැඩසටහන් 06 කින් 03ක ප්‍රගතිය 0ක් විය. | පැවති කොවිඩ් තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | නිමකළ හැකි කාර්යයන් පමණක් සැලැස්මට ඇතුලත් කළ යුතුය. |
| (ආ) | දේශීය කර්මාන්ත අංශයන් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමත්, එමඟින් උසස් නිමැවුමෙන් හා ගුණාත්මකභාවයෙන් යුක්ත වූ භාණ්ඩ බිහි කරමින් ජාත්‍යන්තර වෙළඳපොල ජය ගැනීමට හැකි තත්ත්වයක් නිර්මාණ කිරීමේ අරමුණින් සංවර්ධන අංශ II පිහිටුවා ඇති අතර එහි කාර්යසාධනය පරික්ෂාවේදී සැලැස්ම තුල ඇතුලත් කර තිබූ වැඩසටහන් 03 හිම ප්‍රගතිය 0ක් විය. | පැවති කොවිඩ් තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | -එම- |
| (ඇ) | කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්වය සහ ව්‍යවසායකයින් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය III වාණිජ්‍ය බැංකු හා පෞද්ගලික බැංකු හරහා කර්මාන්තකරුවන්ට ණය නිකුත් කරනු ලැබුවද කර්මාන්තකරුවකුට ලබාදුන් ණය ප්‍රමාණය, ණය වාරිකය, පොලිය, ලැබිය යුතු ණය වාරිකය හා පොලී ශේෂය යනාදිය ගණනය කළ හැකි ක්‍රමයක් අරමුදල මඟින් පවත්වාගෙන ගොස් නොතිබුණි. ඒ සඳහා 2016 වර්ෂයේ දී | මෙම ණය යෝජනා ක්‍රමය සඳහා තෝරා ගෙන ඇත්තේ ප්‍රධාන පෙළේ බැංකු ආයතන වේ. මෙකී ආයතනවල මහ බැංකුවේ උපදෙස් මත ඉතා විශ්වාසනීය Loan Automation System ස්ථාපිත කර ඇති අතර බැංකු සමඟ අත්සන් කරන ලද ගිවිසුම් ප්‍රකාරව හා විශ්වාසය මත මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ. අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද | ස්වයංක්‍රිය ණය පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ස්වයංක්‍රිය ණය පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රු.757,025 ක් හා 2017 වර්ෂයේ දී දත්ත ඇතුලත් කිරීමට, පුහුණු නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන රු.174,200 ක මුදලක් වැයකර තිබුණි. එම ව්‍යාපෘතිය අතර මග නවතා ඇති අතර ඒ හේතුවෙන් නිශ්චිත දිනයකදී එක් එක් ණයකරුවන්ගෙන් ලැබිය යුතු මුදල නිවැරදිව හඳුනා ගැනීමට අරමුදලට නොහැකි වී තිබුණි. අර්ධ වාර්ෂිකව බැංකු වලින් ලැබෙන ණය වාරික හා පොලිය නිවැරදි යැයි උපකල්පනය කර ගිණුම්ගත කිරීම හැර සත්‍ය වශයෙන්ම ණයකරුවන්ගෙන් ලැබිය යුතු මුදල් ප්‍රමාණයේ නිරවද්‍යතාවය ගණනය කිරීමේ හැකියාවක් අරමුදලට නොතිබුණි. | ණය සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සතුව පවතින අතර බැංකුව විසින් ව්‍යාපෘති කළමනාකරන ඒකකය වෙත එවනු ලබන ණය වාරික හා පොලිය බැංකුවේ විගණන අංශය විසින් පරීක්ෂා කිරීමෙන් පසුව අප වෙත යොමු කරනු ලැබේ.<br>කෙසේ වෙතත් ණය යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ක්ෂණිකව තොරතුරු ලබා ගැනීමේ අරමුණෙන් ස්වයංක්‍රිය ණය පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු සිදු කරන ලදී. එසේම එකී පද්ධතියට තොරතුරු ඇතුළත් කිරීමේ කටයුතු සිදු කරන ලදී. එම දත්ත අමාත්‍යාංශයේ ප්‍රධාන සර්වයේ (Main sever) ගබඩා කර තිබූ නිසා ප්‍රධාන සර්වයේ ඇති වූ දෝෂයක් හේතුවෙන් එම සර්වය අක්‍රිවය වී ඇති බැවින් එයට ඇතුළත් කරන ලද දත්ත ද නැවත ලබා ගැනීමට නොහැකි වී ඇත. කෙසේවෙතත් නැවත ස්ථාපිත කර ගැනීමේ කටයුතු ආරම්භ කළත් එකී ආයතනයේ කටයුතු අක්‍රීය තත්වයේ පැවැතීම හේතුවෙන් මෙතෙක් පද්ධතිය යථා තත්වයට පත් කර ගැනීමට අපහසුවී ඇත. | |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශය යටතේ පවතින කර්මාන්තපුර 33 හි ඇති ඉඩම් කට්ටි 1001කින් ඉඩම් කට්ටි 791ක් විවිධ ආයෝජන කටයුතු සඳහා කර්මාන්තකරුවන්ට ලබා දී තිබූ අතර ඉඩම් කට්ටි 78 ක් එනම් පර්චස් 4968.2ක් නිශ්කාර්යව පැවතිණි. මධ්‍යම පළාතේ නාලන්ද කර්මාන්තපුරයේ මුළු බිම් කට්ටි | පවතින හිස් ඉඩම් කට්ටි 31 සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනිමෙන් පසුව ආයෝජකයන් වෙත ලබාදීමට නියමිතයි.නාලන්ද කර්මාන්තපුරයේ හිස් ඉඩම් කට්ටිවලට වර්තමානයේ පවතින නඩු නිරවුල් වීමෙන් පසු ඉදිරි කටයුතු කිරීමට නියමිතය. උතුරු හා නැගෙනහිර | සුදුසු ආයෝජකයින් තෝරා ඉඩම් ලබාදී කර්මාන්ත ආරම්භ කරවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 38 න් 08ක් අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව 2018 වර්ෂයේ සිට කර්මාන්ත පවත්වාගෙන යන අතර උතුරු පළාතේ ඉඩම් කට්ටි 31න් 8ක් පමණක් කර්මාන්තකරුවන්ට ලබා දී තිබුණි. | පළාත්වල ආයෝජනය කිරීම සඳහා කර්මාන්තකරුවන්ගේ යොමු වීම අවම මට්ටමක පවතී. | |
| (ආ) | කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්වය සහ ව්‍යවසායකයින් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය III යටතේ සාමාන්‍ය ණය යෝජනා ක්‍රමය හා තාක්ෂණික හුවමාරු සහයෝගී ණය යෝජනා ක්‍රමය වශයෙන් උප ව්‍යාපෘති 2ක් සඳහා ණය පහසුකම් සැලසිය යුතු වුවත් සාමාන්‍ය ණය යෝජනා ක්‍රමය මත පමණක් ණය පහසුකම් ලබා දී තිබුණි. | මෙම ණය යොජනා ක්‍රමයෙන් ණය ලබා ගැනීමට ඉල්ලුම් කරන ලද ව්‍යාපාරිකයින්හට මෙම තාක්ෂණ හුවමාරු ණය යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් දැනුවත් කිරිම් සිදු කරනු ලැබුවත් ඒ සඳහා කරනු ලබන ඉල්ලීම් ඉතා අඩු මට්ටමක පවති.<br>කෙසේ වුවත් පසු ගිය වර්ෂවලදී ව්‍යාපාරික අවශ්‍යතාව පරිදි තාක්ෂණ හුවමාරු ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපාරිකයින් කිහිප දෙනෙකු සඳහා ණය නිකුත් කර ඇත. එසේම ඉදිරියේ දී මේ සම්බන්ධයෙන් දැනුවත් කිරිමේ කටයුතු සිදු කිරිමට ද කටයුතු සිදු කරමි. | තාක්ෂණික හුවමාරු සහයෝගී ණය යෝජනා ක්‍රමයද ව්‍යාප්ත කරවීමට කටයුතු කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය සතු වාහන 5 ක් වර්ෂ 1 - 4 අතර කාල පරාසයක සිට අළුත්වැඩියා කිරීමකින් තොරව අමාත්‍යාංශ භූමියේ රඳවා තිබුණි. මෙම වාහන 5 තුළ 2013, 2014 වර්ෂවල මිලදී ගත් මෝටර් රථ 02 ක්ද ඇතුලත් විය. එසේම අපහරණය කළ යුතු මට්ටමේ පවතින වාහනයක්ද 2020 අගෝස්තු 28 දිනැති හා අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 13.2 වගන්තිය අනුව හා මු.රෙ.770 (4) ප්‍රකාරව කටයුතු කළ යුතු වුවත් අමාත්‍යාංශය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | වාහන අලුත්වැඩියාව කිරීම සඳහා වර්ෂයකට රුපියල් මිලියන 8ක් පමණ ප්‍රතිපාදන වෙන් වන අතර මෙම වාහන අලුත්වැඩියා කිරීම සඳහා මෙම ප්‍රතිපාදන වෙන් කල හොත් දෛනිකව ධාවනය කරන වාහන අලුත්වැඩියා කිරීමට නොහැකි වේ. එබැවින් ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති කම නිසා වාහන අලුත්වැඩියා කිරීමකින් තොරව අමාත්‍යාංශ පරිශ්‍රයේ ගාල්කර තිබුණි.<br>මේ වන විට අමාත්‍යාංශයේ අපහරණය කල යුතු වාහන හඳුනාගෙන අපහරණය කිරීම සඳහා 2022.03.25 දින කමිටු පත් කර අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතියි. | කඩිනමින් අළුත්වැඩියාවට යොමුකළ යුතු අතර අපහරණය කළ යුතු මට්ටමේ වාහන ඉවත්කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වසර 03කට වැඩි කාලයක සිට අළුත්වැඩියාවන් සඳහා පෞද්ගලික ගරාජ වලට යොමුකර තිබූ වාහන 03ක් 2022 මර්තු 15 වන විටත් අළුත්වැඩියාවන් සිදු කර ධාවනයට එක්කර නොතිබුණි. | <u>**අංක KG - 8980 දරන වාහනය**</u><br>2019 මාර්තු 18 දින නඩුවට යටත්ව බැඳුම්කරයක් මගින් අමාත්‍යාංශයට භාර දී ඇත. මේ වන විට නඩුව අවසන් වී ඇති බැවින් නඩු වාර්තාව ලැබුණු පසු නීති උපදෙස් මත වාහනය අලුත්වැඩියා කිරීමට යොමු කල යුතුව පවතියි.<br><u>**අංක PD - 6293 දරන වාහනය**</u><br>සමුපකාර රක්ෂණ සමාගම අලුත්වැඩියාව සඳහා අනුමත කළ මුදල ප්‍රමාණවත් නොවන බව ගරාජය විසින් දැන්වූ බැවින් එය සංශෝධනය කරන ලෙස 2021.10.25 දින සමුපකාර රක්ෂණ සමාගම දැනුවත් කරන ලදී.<br><u>**අංක PE 1898 දරන වාහනය**</u><br>අනතුරකදී වාමුවාව පළුදුවී ඇති බව රක්ෂණ ආයතනයට හෝ අදාළ පොලීස් ස්ථානයට දන්වා නැත. එසේ දැනුවත් නොකිරීම නිසා රක්ෂණ වන්දි ලබා ගැනීමට නොහැකි විය. පසුගිය කාල වකවානුවේ කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් රට තුළ පැවති සංචරණ සීමා හා ඇඳිරිනීති තත්වය මත අවශ්‍ය අමතරකොටස් සොයා ගැනීමට නොහැකිවීම නිසා අලුත්වැඩියාව ප්‍රමාදවී ඇත. | -එම- |
| (ඇ) | දකුණු පළාතේ බටඅත කර්මාන්තපුරයේ ඉදිකරන ලද පරිපාලන ගොඩනැගිල්ල භාවිතයට ගත නොහැකිව අබලන් තත්ත්වයේ පැවතිණි. | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් විසින් ලබාදුන් වාර්තාවට අනුව මෙම ගොඩනැගිල්ල පරිහරණය කිරීමේ අවධානම් තත්ත්වයක් පවතී. | කඩිනමින් අළුත්වැඩියාවන් සිදු කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කර්මාන්ත අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයට අදාලව සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව නීති අංශයේ ඇතැම් අයිතම් වල තථ්‍ය ශේෂය හා ලෙජරය අනුව ශේෂයේ වෙනස්කම් පැවතිණි. 2020 හා 2021 වර්ෂ වල භාණ්ඩ සමීක්ෂණ වාර්තා වලට අනුව දකුණ, ඌව-බදුල්ල හා සබරගමුව ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන වල 2020 වර්ෂයේ සිට පැවත එන ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ 2021 වර්ෂයේදීද එලෙසම පවතින බවත් ඒවා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ලෙජරයේ සටහන් කිරීමේදී සිදු වූ ප්‍රමාද දෝෂයක් නිසා නීති අංශයේ අයිතම කිහිපයක තථ්‍ය ශේෂය ලෙජරය අනුව ශේෂය සමග වෙනස් වී ඇති බැවින් එම වැරදි නිවැරදි කිරීමෙන් පසු ලෙජරය අනුව ශේෂය හා තථ්‍ය ශේෂය සමාන විය.<br><br>කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන වල භාණ්ඩ අපහරණ කටයුතු සිදු කිරීමට නොහැකි වූ බැවින් මෙම වර්ෂය තුල අපහරණ කටයුතු සිදුකිරීමට කටයුතු කරන බව දන්වමි. | ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ජපානයෙන් ගෙන්වන ලද වාහන කොටස් එකලස් කිරීමේ කටයුතු සඳහා මිනුවන්ගොඩ කර්මාන්තපුරයෙන් අක්කර 2ක භූමි ප්‍රමාණයක් 2002 ජුනි 11 දින පුද්ගලික සමාගමකට ලබා දී තිබුණි. අමාත්‍යාංශයේ අක්‍රීය හා ඌන උපයෝජන සහිත ව්‍යාපෘති වාර්තා වලට අනුව එහි රු.මිලියන 500 ක ආයෝජනයක් හා රැකියා අවස්ථා 100 ක් ජනිත කිරීමට එකඟ වී තිබුණි. ඒසේ වුවද වසර 9කට ආසන්න කාලයක් තිස්සේ මෙහි ව්‍යාපාර කටයුතු නවතා දමා තිබුණු අතර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් මෙම ආයතනයට බදු ඔප්පුවක් ලබාදී නොමැති බැවින් විශාල බදු මුදලක් ගෙවීමට ඇති බවද අනාවරණය විය. ක්ෂේත්‍ර | වාහන ලියාපදිංචිය හා වෙනත් නෛතික කරුණු මත ශ්‍රේෂ්ඨාධිකරණයේ පවතින නඩු කටයුතු හේතුවෙන් මෙම ව්‍යාපාරය නැවත ආරම්භ කිරීමට නොහැකි වී ඇති බව දන්වා ඇත. මෙම නෛතික ගැටළුව අවසන් වන තෙක් වැඩ කටයුතු ආරම්භ කිරීමට නොහැකි තත්වයක් උද්ගත වී ඇති බැවින් එය නිරාකරණය කිරීමෙන් අනතුරුව මෙම කර්මාන්තයේ කටයුතු ආරම්භ කරන කරන බව අදාළ කර්මාන්තකරු විසින් අමාත්‍යාංශය වෙත දන්වා ඇත.<br>මෙය අධිකරණයේ පවතින ගැටළුවක් බැවින් එය නිරාකරණය කර ගන්නා තෙක් අමාත්‍යාංශයට මැදිහත්වීමක් සිදු | නෛතික ගැටළු ඇති නොවන කර්මාන්ත කෙරෙහි අවධානය යොමුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පරීක්ෂාවේ දී මෙම ස්ථානයේ වාහන එකලස් කිරීම සිදුකරමින් නොපැවති අතර වර්ග අඩි 3000ක පමණ ගොඩනැගිලි 2ක් නිශ්කාර්යව පැවතිණි. මෙසේ විශාල ඉඩමක් ඵලදායි නිෂ්පාදන කටයුත්තකට ලබා නොදීමෙන් රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් හා රජයේ ආදායමට බැර විය යුතු විශාල ආදායමක්ද අහිමි වී ගොස් තිබුණි. | කළ නොහැක. | |
| (ආ) | මීනුවන්ගොඩ කර්මාන්තපුරයේ පර්චස් 29කින් සමන්විත බිම් කට්ටියක පොදු පහසුකම් හා පරිපාලන ගොඩනැගිල්ලක් ඉදි කිරීමට තීරණය කර තිබුණද පරිපාලන ගොඩනැගිල්ල ඉදි කිරීමට හෝ කිසිදු ව්‍යාපාරික කටයුත්තකට බෙදා දීමට හෝ මෙතෙක් කටයුතු කර නොතිබුණි. | මෙම බිම් කොටස කර්මාන්තපුරයේ පොදු පහසුකම් හා පරිපාලන ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා වෙන් කර තිබූ අතර ඉදිරියේදී ඒ පිළිබඳව සුදුසු පරිදි කටයුතු කරනු ඇත. | ප්‍රයෝජනවත් කාර්යයන් වෙනුවෙන් ඉඩම ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වානේ සහ දැවමය නිවාස සහ කාර්යාලීය ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා මහර කර්මාන්තපුරයේ පර්චස් 49.5 කින් යුත් කැබලි අංක 06 බිම් කට්ටිය 2007 ජනවාරි 19 දින පුද්ගලික සමාගමක් වෙත ලබා දී තිබුණි. විගණනය විසින් සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවට අනුව ව්‍යාපෘති වාර්තාවේ ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුරූපී ව්‍යාපාර කටයුතු සිදු නොවන බවත් සේවකයින් 100 වෙනුවට තිදෙනෙකු පමණ ව්‍යාපාර කටයුතු වල යෙදෙන බවත්, ප්‍රමාණවත් නිෂ්පාදනයක් නොකෙරෙන බවත් මහර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 27 දිනැති ම/ඉ/2/5-4 ප්‍රාදේශීය ලේකම්ගේ ලිපිය පරිදි 2007 වසරේ සිට මෙම ආයතනය බදු මුදල් ගෙවීම පැහැර හැර ඇති බවත් අනාවරණය විය. | මෙම ආයතනය නිෂ්පාදන කටයුතු නිසි පරිදි සිදු නොකිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් වරින් වර මෙටල්වුඩ් ආයතනයෙන් කරුණු විමසා ඇති අතර මේ සම්බන්ධව ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව වෙතද කැඳවා විමසීම් සිදු කර ඇත. මෙම ආයතනය වෙත බදු මුදල් ගෙවීම සඳහා වසරක සහන කාලයක් ලබා දුන් බව ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් දැනගැනීමට හැකිවිය. ඒ අනුව ඉඩම් කොමසාරිස්ගේ හෝ මහර ප්‍රාදේශීය ලේකම්ගේ උපදෙස් ලැබෙන තෙක් තීරණයක් ගැනීම කල්දැමීමට කමිටුව තීරණය කරන ලදි. | ප්‍රයෝජනවත් කාර්යයන් වෙනුවෙන් ඉඩම ලබාදීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අමප/16/1424/723/039 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ටතා මධ්‍යස්ථාන ව්‍යාපෘතිය **(CERA)** ආරම්භ කිරීමට අවශ්‍ය යන්ත්‍ර මිලදී ගැනීමට හා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩල ගොඩනැගිල්ලක් නවීකරණය කිරීමට රු.මිලියන 120 ක් පමණ වැය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා බඳවා ගත් විධායක නිලධාරියාට 2017 සැප්තැම්බර් සිට 2018 ඔක්තෝබර් දක්වා කාලයට මසකට රු.725,000 බැගින් වැටුප් හා දීමනා ලෙස එකතුව රු.මිලියන 11 ක් පමණ ගෙවා තිබුණද සමාගමක් වශයෙන් ලියාපදිංචි කර අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීම කර නොතිබුණි. මෙම ව්‍යාපෘතියේ අසාර්ථකත්වය මත කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති මෙම ව්‍යාපෘතිය 2018 දෙසැම්බර් 28 දිනැති 2013 /14 දරණ ගැසට් පත්‍රය මගින් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වෙත පවරා තිබූ අතර නැවත 2020 අගෝස්තු සිට කර්මාන්ත අමාත්‍යාංශය යටතට පවරා තිබුණි.<br>ඉන් පසුව මෙම ව්‍යාපෘතිය 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ සීමාසහිත සමාගමක් ලෙස පිහිටුවීමටත්, කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත සභාපතිවරයෙකු හා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කිරීමටත් 2020 දෙසැම්බර් 01 දිනැති අමප/20/1725/320/025 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයකින් අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වුවද හිටපු කර්මාන්ත අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව භාණ්ඩාගාර ලේකම් විසින් සභාපතිවරයෙකු හා අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි. කෙසේ වුවද 2017 වර්ෂයේ සිට 2022 අප්‍රේල් අවසන් වන විටත් එනම් වර්ෂ 05 කට අධික කාලයක සිට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩල නව බිම ගොඩනැගිල්ලේ මෙම උපකරණ නිශ්කාර්යව සමහර භාණ්ඩ මළ බැඳෙමින් පැවැතිණි. ලංකාවේ කර්මාන්ත වලට ධෛර්යය දීම, ඒවා වැඩි දියුණු කිරීම හා | අමාත්‍යාංශ නිතර මාරුවීම හා පැවතුන මතභේද හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම මන්දගාමී තත්ත්වයේ පැවතිණි. කෙසේ වුවද මෙම ව්‍යාපෘතිය ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක කිරීමට වර්තමනයේ සැළසුම් කර ඇත. | වැය කළ මුදල නිශ්කාර්ය වීමට නොදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමට කටයුතු කළ යුතුය. |

සංවර්ධනයට සහාය වීමේ අරමුණින් මෙම රොබෝ තාක්ෂණය සඳහා විශිෂ්ටතා මධ්‍යස්ථානය ආරම්භ කර තිබුණද මෙතෙක් එය ඉටුකර නොතිබුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) 4.1 කාර්ය මණ්ඩලය**<br>(අ) 2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 391ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 314ක් විය. ඒ අනුව පුරප්පාඩු 78ක් හා එක් තනතුරක අතිරික්තයක් නිරීක්ෂණය විය. එනම් ජොෂ්ඨ, තෘතියක, ද්විතියික හා ප්‍රාථමික මට්ටම් වල පිළිවෙලින් 15, 02, 46 ක් හා 15ක් වශයෙන් පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු පුරවන ලෙස දන්වා ඇතත් මේවන තෙක් පුරවා නැත. | අත්‍යාවශ්‍ය තනතුරුවල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) අමාත්‍ය කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ දැයට පුනරුදයක් කර්මාන්තයට ජීවයක් ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය ලෙස කාර්මික සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් 06 දෙනෙකු අනුයුක්ත කර තිබුණි. අමාත්‍ය කාර්ය මණ්ඩලය සිටියදී කාර්මික සංවර්ධන මණ්ඩලයේ නිලධාරින් මෙම ව්‍යාපෘතිය සඳහා යොදවා 2021 සැප්තැම්බර් මස සිට දෙසැම්බර් දක්වා එම නිලධාරීන්ට වැටුප් හා දීමනා ලෙස රු.1,101,244ක් කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ගෙවා තිබුණි. | මේ සම්බන්ධයෙන් කිසිම තොරතුරක් අමාත්‍යාංශය සතුව නැත. | කාර්ය මණ්ඩලය බඳවාගත් අරමුණු වෙනුවෙන් යෙදවිය යුතුවේ. |